# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2419/29 - 2025 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2025.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 21/78 (XVI)A(I)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2025 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය

නියමාවලිය

1. මේ නියමාවලිය 2025 අංක 01 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2025 ජනවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 2017 දෙසැම්බර් මස 08 වැනි දින, අංක 2048/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 05 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 9 වන ඡේදයේ -

(අ) (1) වන අනුඡේදයේ (ඉ) අනු-අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''(ඉ) ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා;'' ;


1A - PG 7001 — 54 (2025/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) (1) වන අනුඡේදයේ (උ) අනු-අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(උ) කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරුන් සහ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරුන්.'' ;

(ඇ) (2) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(අ) ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරා පත්කරනු ලබන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ එක් එක් ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රමවල විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් අතරින් එක් සාමාජිකයකු බැගින් ;

(ආ) නීතිය, පරිපාලනය සහ මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනකු ;

(ඇ) විශ්වවිද්‍යාල පාලක සභාවට පත් කර ගන්නා ලද සාමාජිකයන් අතරින් පාලක සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු,";

(2) එහි 11 වන ඡේදයේ (3) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(අ) ආයතනයේ දේපළ සහ අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම;";

(3) එහි 12 වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"12 මණ්ඩලය විසින් පහත සඳහන් එක් එක් වෛද්‍ය ක්‍රමයක් සඳහා අධ්‍යයන මණ්ඩල ද අදාළ අධ්‍යයන මණ්ඩල යටතේ විශේෂඥ මණ්ඩල ද පිහිටුවිය යුතු යː-

(අ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාව;

(ආ) සිද්ධ වෛද්‍ය විද්‍යාව; සහ

(ඇ) යුනානි වෛද්‍ය විද්‍යාව.";

(4) එහි 13 වන ඡේදයේ (1), (2), (3) සහ (4) වන අනුඡේද ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(1) ආයුර්වේද වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) නිල බලයෙන් පත් වන්නා වූ සාමාජිකයෙකු විය යුතු අධ්‍යක්ෂවරයා;

(ආ) (4) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨ මණ්ඩලය විසින්, එකී පීඨයේ ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙළට, තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

(ඇ) (4) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨ මණ්ඩලය විසින්, එකී පීඨයේ ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වරුන්, සහාය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙලට, තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

(ඈ) (4) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරු විසින් නම් කරනු ලබන, එකී පීඨයන්හි ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් සහය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙලට, පහත දැක්වෙන ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ එක් එක් විශේෂඥ ක්ෂේත්‍රවලින් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුː-

(i) කායචිකිත්සා ;

(ii) ශල්‍ය ශාලාක්‍ය ;

(iii) ප්‍රසුතිතන්ත්‍ර කෞමාරභෘත්‍යය ;

(iv) දේශීය චිකිත්සා ;

(v) ස්වස්ථවෘත්ත ;

(vi) ද්‍රව්‍යගුණ විඥාන ;

(vii) ශරීර විඥාන; සහ

(viii) මෞලික සිද්ධාන්ත ;

(ඉ) ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන පහත සඳහන් පුහුණු මධ්‍යස්ථානවලින් එක් අයකු බැගින් වන ආයුර්වේද වෛද්‍යවරයකු බැගින් ආයුර්වේද විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් තිදෙනකුː-

(i) කොළඹ ආයුර්වේද ශික්ෂණ රෝහල ;

(ii) ගම්පහ ආයුර්වේද ශික්ෂණ රෝහල ;

(iii) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය.

(2) සිද්ධ වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) නිල බලයෙන් පත්වන්නා වූ සාමාජිකයෙකු විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) (4) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨ මණ්ඩලය විසින්, එකී පීඨයේ ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙලට, තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු ;

(ඇ) (4) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨ මණ්ඩලය විසින්, එකී පීඨයේ ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් සහය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙලට, තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

(ඈ) (4) වන අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරු විසින් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙලට, එකී පීඨයන්හි සිද්ධ වෛද්‍ය විද්‍යාවේ පහත දැක්වෙන එක් එක් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ː-

(i) නොයි නාඩල් විකිත්සෙෙ ;

(ii) විරණ විකිත්සෙෙ;

(iii) කුලන්දයි මරුතුවම් හා මහලිර් මරුතුවම් ;

(iv) ගුණපාඩම් ; සහ

(v) මූල තත්තුවම්;

(ඉ) ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන පහත දැක්වෙන පුහුණු මධ්‍යස්ථානවලින් සිද්ධ විශේෂඥ ශ්‍රේණියේ එක් වෛද්‍යවරයකු බැගින් වූ සිද්ධ විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් තිදෙනකු:-

(i) සිද්ධ ශික්ෂන රෝහල, කයිතඩි, යාපනය;

(ii) සිද්ධ ශික්ෂණ රෝහල, ත්‍රිකුණාමලය;

(iii) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය.

(3) යුනානි වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) නිල බලයෙන් පත් වන්නා වූ සාමාජිකයෙකු විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ආ) (4) අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨ මණ්ඩලය විසින්, එකී පීඨයේ ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙලට, තෝරා පත් කරගනු ලබන යුනානි වෛද්‍ය විද්‍යා අංශයේ සාමාජිකයන් දෙදෙනකු;

(ඇ) (4) අනුඡේදයේ (අ) අනු-අනුඡේදයේ නියම කර ඇති අවශ්‍යතාවය සපුරාලීමට යටත්ව, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති විසින්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් එම අනුපිළිවෙලට, එකී පීඨයෙහි යුනානි වෛද්‍ය විද්‍යාවේ පහත දැක්වෙන එක් එක් විශේෂඥ ක්ෂේත්‍රවලින් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුː-

(i) මෞලිජාත් ;

(ii) ඉල්මුල් ජරාහත් ;

(iii) අම්රාස්-ඊ-නිස්වාන් වො කබලාත් වො අට්ෆාල් ;

(iv) දේශීය ඉලාජ් ;

(v) තහෆුසි වො සමාජි තිබ් ;

(vi) ඉල්මුල් අද්වියා; සහ

(vii) කුල්ලියාත් ;

(ඈ) ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන පහත දැක්වෙන පුහුණු මධ්‍යස්ථානවලින් යුනානි විශේෂඥ ශ්‍රේණියේ එක් වෛද්‍යවරයකු බැගින් වූ යුනානි විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් දෙදෙනකු ː-

(i) කොළඹ ආයුර්වේද ශික්ෂණ රෝහල ;

(ii) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය.

(4) එක් එක් අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් නම් කිරීම පහත දැක්වෙන පරිදි විය යුතු යඃ-

(අ) නියමාවලියේ 24 වන ඡේදය යටතේ පුහුණුකරුවකු වීම සම්බන්ධයෙන් නියම කර ඇති අවශ්‍යතා සපුරාලනු ලබන දේශීය වෛද්‍ය පීඨවල සාමාජිකයන් අදාළ පීඨ මණ්ඩල විමසා එකී පීඨවල පීඨාධිපතිවරුන් විසින් නම් කරනු ලැබිය යුතු අතර එකී පීඨවල පීඨාධිපතිවරුන් විසින් එම නම් කිරීම් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) අදාළ රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් හෝ පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රධානියා විසින් මුලසුන දරනු ලබන රැස්වීමක දී, නියමාවලියේ 24 වන ඡේදය යටතේ පුහුණුකරුවකු වීම සම්බන්ධයෙන් නියම කර ඇති අවශ්‍යතා සපුරාලනු ලබන විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් අතරින් පුහුණු මධ්‍යස්ථානවල සාමාජිකයන් නම් කරනු ලැබිය යුතු ය. එම නම් කිරීම් ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.";

(5) 24 වන ඡේදයේ "ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය", "සිද්ධ වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" සහ "යුනානි වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඉවත් කර, ඒ වෙනුවට පිළිවෙලින් පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන් ඃ-

"ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙන්, කායචිකිත්සා, ශල්‍ය ශාලාක්‍ය, ස්ත්‍රී රෝග හා ප්‍රසූතිතන්ත්‍ර, කෞමාරභෘත්‍යය, දේශීය චිකිස්තා, ස්වස්ථවෘත්ත, අගදතන්ත්‍ර, ද්‍රව්‍යගුණ විඥාන, භෛෂජ්‍ය කල්පනා සහ රස ශාස්ත්‍ර, ශරීර විඥාන හා මෞලික සිද්ධාන්ත අදහස් වේ;

"සිද්ධ වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙන්, සිද්ධ මරුතුවම්, නොයි නාඩල් චිකිත්සෙ, විරණ චිකිත්සෙ, අරුවෙ මරුතුවම්, සිරෝරෝග මරුතුවම්, පෙන් නොයියල්, මහලිර් මරුතුවම්, මහපෙට්රු මරුතුවම්, කුලන්දයි මරුතුවම්, පරම්පරෙ මරුතුවම්, සමූහ නල මරුතුවම්, නන්ජියල්, ගුණපාඩම්, සිද්ධ මරුන්තියල් හා සිද්ධ මූලතත්තුවම් අදහස් වේ; සහ

"යුනානි වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙන්, මෞලිජාත්, ඉල්මුල් ජරාහත්, අම්රාස්-ඊ-අයින් අන්ෆ් උස්න් වො හලක්, අම්රාස්-ඊ-නිස්වාන් වො කබාලත් වො අට්ෆාල්, අම්රාස්-ඊ-අට්ෆල්, දේශීය ඉලාජ්, තහෆුසි වො සමාජි තිබ්. ඉල්මුල් සුමූන්, ඉල්මුල් අද්වියා, ඉල්මුල් සෛද්ලා, තස්රීහ්-ඊ-බදන්, මුනෆ්ෆි උල් ආසා, කුල්ලියාත් අදහස් වේ.".

EOG 01 - 0144

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.